# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ඇතුළත් කරගැනීම

## ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය
## ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධිය

**මාධ්‍යය : ඉංග්‍රීසි**

ඉහත සඳහන් උපාධි වැඩසටහන්වල අධ්‍යයන කටයුතු සඳහා, සිසුන් තෝරා ගැනීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය - 2022 සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

ප්‍රවේශ අවශ්‍යතා, අයදුම්පත් ක්‍රියාපටිපාටිය, අවශ්‍ය ලේඛන, ප්‍රායෝගික පරීක්ෂණ හා අනෙකුත් විස්තර ලබාගැනීම සඳහා අපගේ වෙබ් අඩවිය වන www.sab.ac.lk වෙත යොමුවන මෙන් කරුණාවෙන් ඉල්ලීමක් කෙරේ.

**ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා හෝ ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය හා ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධිය යන වැඩසටහන් දෙකම සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ අභියෝග්‍යතා පරීක්ෂණයට අයදුම්කළ යුතුය.**

ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහනට පමණක් අයදුම් කරනු ලබන අයදුම්කරුවන්හට අදාළ අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයට හෝ තමන්ගේ වඩා කැමැති වෙනත් අදාළ විශ්වවිද්‍යාලයක් වෙත අයදුම් කළ හැක. මෙම ප්‍රමුඛතාවය, අයදුම්කරුවන් තේරී ඇති විශ්වවිද්‍යාලයක් සඳහා බලපෑමක් නොමැත.

එක් අයදුම්කරුවකුහට අදාළ උපාධි වැඩසටහන් දෙකටම අයදුම් කළ හැක. එවන් අවස්ථාවකදී, ඔවුන් විසින්, අදාළ ලේඛනවල ස්කෑන් පිටපත් සමග **එක් මාර්ගගත අයදුම්පතක් පමණක්** පිරවිය යුතුවේ.

**අයදුම්කරු විසින්, අදාළ අයදුම්පත, ලබාදී ඇති සබැඳිය හරහා මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමග අධ්‍යාපන සහතිකවල මුල් ස්කෑන් පිටපත්, ගෙවුම් වවුචරයේ මුල් පිටපත හා බැංකු ගෙවුම්පතේ (කොළපැහැ පත) මුල් පිටපත අමුණා තිබිය යුතුය.**

මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසාන දිනය, **2022 සැප්තැම්බර්** 19 දින වේ.

අදාළ අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා වන උපලේඛනය පහත පරිදි වේ :

| **ලිඛිත පරීක්ෂණය** | | |
|---|---|---|
| **උපාධි වැඩසටහන** | **දිනය** | **වේලාව** |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන | 2022.10.09 | පෙරවරු 9.00 සිට පෙරවරු 10.00 දක්වා |
| ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන | 2022.10.09 | පස්වරු 01.00 සිට පස්වරු 02.00 දක්වා |

| **ප්‍රායෝගික පරීක්ෂණ (උපාධි වැඩසටහන් දෙකම සඳහා)** | |
|---|---|
| **දිනය** | **වේලාව** |
| 2022.10.09 | ප.ව. 01.00 සිට ප.ව. 6.00 දක්වා |
| 2022.10.10 | පෙ.ව. 08.00 සිට ප.ව. 6.00 දක්වා |
| 2022.10.11 | පෙ.ව. 08.00 සිට ප.ව. 6.00 දක්වා |

**සටහන :** අදාළ අයදුම්පත් 2022 සැප්තැම්බර් 05 වන දින සිට ලබාගත හැක. (www.sab.ac.lk)

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.**